**හක්මණ ප්‍රාදේශීය සභාව**
**මාතර දිස්ත්‍රික්කය**

## 1 මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 29 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2016 ජූලි 22 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 අගෝස්තු 21 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට හක්මණ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ සමාලෝචිත වර්ෂය සඳහා ලැබිය යුතු රු.508,506 ක්, ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී රු.2,720,782 ක් වූ ඉදිකිරීම් වියදම් සහ රු.332,121 ක වියදමින් මිලදී ගෙන තිබුණු ස්ථාවර වත්කම් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඇ) පරිත්‍යාග ලෙස සභාවට ලැබී තිබූ පරිගණක යන්ත්‍ර සහ උපකරණ 05 ක වටිනාකම ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ රු.1,822,370 ක් වූ කර්මාන්ත 03 ක් වෙනුවෙන් ණයගැති හා ණයහිමි ප්‍රතිපාදන අඩුවෙන් සලසා තිබුණු අතර, තවත් කර්මාන්ත 07 ක් වෙනුවෙන් රු.1,106,399 ක් වූ ණයගැති හා ණයහිමි ප්‍රතිපාදන ඇති කර නොතිබුණි.

(ඉ) 2013 වර්ෂයේදී රු.1,188,192 ක වියදමින් ඉදිකර තිබුණු බහුකාර්ය ගොඩනැඟිල්ලේ සහ ඉඩමේ වටිනාකම සභාවේ වත්කම් ලෙස ගිණුම්ගතකර නොතිබුණි.

## 1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

මූලා ප්‍රකාශනවල ඇතුළත් එකතුව රු. 10,991,744 ක් වූ ගිණුම් විෂයයන් 14 කට අදාළ ශේෂ හා ඊට අදාළ උපයෝගී ලේඛන/උපලේඛනවල දැක්වෙන ශේෂ අතර, එකතුව රු.2,595,614 ක අසමානතා නිරීක්ෂණය විය.

## 1.3.3 අවිනිශ්චිත ගිණුම

නිරවුල් කිරීමට පියවර නොගෙන දිගින් දිගටම ගිණුම්වල ඉදිරියට ගෙනෙමින් පවතින අවිනිශ්චිත ගිණුමේ වූ රු.873,211 ක හර ශේෂය හඳුනාගෙන අදාළ ගැලපීම් කර ගිණුම් නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි.

## 1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.6,990,621 ක් වූ කර්මාන්ත ණයගැති ශේෂයට වර්ෂ 03 ක කාලයක් ඉක්මවූ රු.49,990 ක් වූ ශේෂයක් ඇතුළත්ව තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ අවසානයට එකතුව රු.14,073,427 ක්වූ කර්මාන්ත ණයහිමි ශේෂය තුළ වර්ෂ 03 ක කාලයක් ඉක්මවූ රු.5,125,991 ක ශේෂ 92 ක් ඇතුළත් වී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ අවසානයට එකතුව රු.6,744,350 ක් වූ ටෙන්ඩර් තැන්පතු, මිශ්‍ර තැන්පතු හා එක්වන් තැන්පතු ශේෂ තුළ වසර 03 ක කාලයක් ඉක්මවූ රු.2,746,771 ක ශේෂ 240 ක් ඇතුළත් වී තිබුණි.

(ඈ) ඉකුත් වර්ෂවල සිට නිරවුල් නොකර ඉදිරියට ගෙනෙමින් පවතින එකතුව රු.608,228ක්වූ ආපසු ගෙවිය යුතු තැන්පතු ශේෂ 07 ක් නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි.

## 1.3.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

එකතුව රු.195,790,360 ක් වූ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් විධිමත්ව හා යාවත්කාලීනව පිළියෙල කරන ලද ස්ථාවර වත්කම් ලේඛණය සහ වාර්ෂික සමීක්ෂණ මණ්ඩල වාර්තාද, පිළිවෙලින් එකතුව රු.6,990,621 ක් හා එකතුව රු.14,073,427 ක් වූ විවිධ ණයගැති සහ ණයහිමි ශේෂ සම්බන්ධයෙන් විධිමත් හා යාවත්කාලීන කරන ලද එම ලේඛණද, එකතුව

රු.2,385,235 ක් වූ දේශීය ණය සංවර්ධන අරමුදලේ ණය ශේෂය සම්බන්ධයෙන් යාවත්කාලීන ණය ලේඛණය හා ශේෂ සනාථ ද, එකතුව රු.1,455,041 ක් වූ තැන්පතු ශේෂ සම්බන්ධයෙන් විස්තරාත්මක උපලේඛන යනාදී සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා, විගණනයේදී ඒවා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

### 1.3.6 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 571 පරිදි වර්ෂ 03 ක කාලයක් ඉක්මවා තිබුණු එකතුව රු.2,077,689 ක් වූ ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු හා මිශ්‍ර තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.7,636,949 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.1,177,140 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 6,459,809 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ මුළු පුනරාවර්තන ආදායමින් සියයට 84 ක් ඉක්ම වූ මුළු පුනරාවර්තන වියදම් පැවතුණි

(ආ) ස්වයං උත්පාදිත ආදායම් ඉක්මවා සමාලෝචිත වර්ෂයේදී මෙන්ම ඉකුත් වර්ෂ දෙකෙහිද සැලකිය යුතු ඉහල අගයන්ගෙන් පුනරාවර්තන වියදම් වැඩිවී තිබූ අතර ස්වයං උත්පාදිත ආදායම් මඟින් පුනරාවර්තන වියදම් ආවරණය කර ගැනීමට කිසිදු ආකාරයකින් හැකියාවක් නොලැබෙන තත්ත්වයක් පෙන්නුම් කෙරුණි.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 වරිපනම් හා බදු

(අ) වරිපනම්

ආරම්භක හිඟය රු.432,920 ක් වූ අතර, රු.1,001,671 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සමග රු.1,434,591 ක් අයවිය යුතුව තිබුණි. මුළු අයවීම් රු.686,372 ක් වීම නිසා වර්ෂය අවසානයට රු.748,219 ක් හිඟව පැවතුණි.

(ආ) අක්කර බදු

ආරම්භක හිඟය රු.46,560 ක් වූ අතර, බිල් කිරීම් රු.7,790 ක් විය. වර්ෂය තුළ මුළු අයවීම් රු.5,120 ක් වූයෙන්, වර්ෂය අවසානයට රු.49,230 ක් හිඟව පැවතුණි.

### 2.3.2 බදු කුලී

ආරම්භක හිඟය රු.226,129 ක් වූ අතර, රු.2,273,073 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සමග රු.2,499,202 ක් අයවිය යුතුව තිබුණි. මුළු අයවීම් රු. 2,131,970 ක් වීම නිසා, වර්ෂය අවසානයට රු.367,232 ක් හිඟව පැවතුණි.

### 2.3.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ අවසානයට උසාවි දඩ වෙනුවෙන් රු.665,037 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු.9,246,695 ක් අයවිය යුතුව තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය අනුව සභාව විසින් විවිධ ප්‍රතිපාදන යටතේ රු.5,600,000ක් වූ වැඩ යෝජනා 32 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණු නමුත්, ඉන් කිසිදු වැඩ යෝජනාවක් ක්‍රියාත්මක කර නොතිබුණි. කෙසේ වුවද, අයවැය ලේඛනයට ඇතුළත් නොකළ එකතුව රු.5,997,175 ක්වූ කර්මාන්ත 06 ක් විවිධ ප්‍රතිපාදන යටතේ වර්ෂය තුළ ක්‍රියාත්මක කර තිබුණි.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

### 3.2.1 මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

සභාවේ සේවක මණ්ඩලය තුළ ද්විතීයික හා ප්‍රාථමික තනතුරුවල පැවති පුරප්පාඩු 05 ක් පිරවීමට හෝ සියළුම තනතුරුවල පැවති 13 ක්වූ අතිරික්ත කාර්ය මණ්ඩලය විධිමත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 3.2.2 සේවක ණය

--------------

සමාලෝචිත වර්ෂයේ අවසානයට සේවක ණය ශේෂය රු. 4,435,909 ක් වූ අතර, වර්ෂ 03 කට වැඩි කාලයක සිට වාරික සහ පොලී අය නොවී පවතින රු.240,190 ක්වූ ශේෂ 03 ක් ඊට ඇතුළත්වී තිබුණි.

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

මඟනැගුම ව්‍යාපෘතිය යටතේ 2013 වර්ෂයේ සිට සභාවට ලැබී තිබූ සියයට 10 ක රැඳවුම් තැන්පතු ඉල්ලීම් වවුචර්පත් 76 කට අදාළ රු.4,686,382 ක් වූ මුදල් 2017 ජුනි 20 දින වන විටත් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවා නොතිබුණි.

## 3.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

----------------------------------

හක්මන ප්‍රාදේශීය සභාව 2012 වර්ෂයේ සිට 2015 වර්ෂය අවසානය දක්වා මඟනැගුම ව්‍යාපෘති යටතේ ඉටුකරන ලද කර්මාන්ත 94 ක් වෙනුවෙන් රැදවුම් මුදල් ගෙවීම සඳහා ලැබී තිබූ රු.4,636,078 ක මුදලක් අදාළ කාර්ය සඳහා යොදවා නොගෙන සභාව විසින් බඳවා ගෙන තිබුණු සේවකයින්ගේ වැටුප් හා දීමනා ගෙවීම සඳහා යොදා ගෙන තිබුණි.

## 3.5 නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජන වත්කම්

------------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) පිරිවැය රු.470,000 ක් වූ වාහන 05 ක් නිෂ්ක්‍රීයව පැවති නමුත්, ඒවා අළුත්වැඩියාකර ධාවනයට යොදවා ගැනීමට හෝ අපහරණය කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ආ) පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු කාය වර්ධන කට්ටලයක් 2011 වර්ෂයේ සිට ද, පිරිවැය රු.130,862 ක් වූ කුට්ටි ගල් මැෂිම 2010 වර්ෂයේ සිටද නිෂ්කාර්යව පැවැතුණි.

## 3.6 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

සන අපද්‍රව්‍ය කළමනාකරණය වෙනුවෙන් කාබනික පොහොර නිෂ්පාදන අංගනයක් ඉදිකිරීමට 2012 වර්ෂයේදී සභා අරමුදලෙන් රු.1,000,000 ක් ගෙවා ඉඩමක් මිලදීගෙන තිබුණු නමුත්, එම කාර්යය ආරම්භ කර නොතිබුණි. එකතු කරනු ලබන කසළ වර්ගීකරණයකින් තොරව ඉඩමකට බැහැර කර පස් දමා වැසීමට කටයුතු කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී කසළ එකතු කිරිම සඳහා රු. 7,388,651 ක් හා ඉකුත් වර්ෂ 05 තුළ කසල කළමනාකරණය වෙනුවෙන් රු.25,247,827 ක් වැයකර තිබුණද, කිසිදු ආදායමක් උපයා ගැනීමට නොහැකි වී තිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

## 4.1 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය වියදම් විෂයයන් 06 ක එකතුව රු. 5,037,007 ක් වූ ඉතිරිවීම් ආදායම් විෂයයන් 04 ක ළඟා කර නොගත් ඉලක්කවල එකතුව රු.2,123,510 ක්ද පැවතීම නිසා අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 4.2 අභ්‍යන්තර විගණනය

ශ්‍රී ලංකා රජයේ මුදල් රෙගුලාසි 133 හා 134 හි දැක්වෙන විධිවිධානයන් සහ දකුණු පළාත් පාලන කොමසාරිස්ගේ 2014 පෙබරවාරි 24 දිනැති අංක දපපා/යහ/01/න.ච.ලේ. දරන චක්‍රලේඛය ප්‍රකාර ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි. කෙස් වුවද, අභ්‍යන්තර විගණන නිලධාරියාට සමාලෝචිත වර්ෂයේදී වැටුප් හා දීමනා ලෙස රු.439,720 ක් ගෙවා තිබුණි.

## 4.3 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම

2009 ජුනි 09 දිනැති අංක ඩීඑම්ජී/2009 (i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටුව පිහිටුවීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

**5.** **පද්ධති හා පාලනයන්**

-------------------------

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) වත්කම් කළමනාකරණය

(ඇ) ආදායම් රැස්කිරීම

(ඈ) අයවැය පාලනය